museum of modern
and contemporary art
sri lanka

**Quarterly Newsletter #7 – April 2024**

‘අක්කර 88: මිනෙට් ද සිල්වා විසින් කළ වටපුළුව නිවාස යෝජනා ක්‍රමය’ නරඹන්නන් 8,000 අධික පිරිසක් පිළිගෙන ඇති බව අප දැනුම් දෙන්නේ ඉතා සතුටිනි. 2023 නොවැම්බර් 30 විවෘත කළ ප්‍රදර්ශනයේ ආරම්භයේ සිට අප වෙත පැමිණි රට පුරා ඇති පාසල් සහ උසස් අධ්‍යාපන ආයතනවල සිසුන් 699ක් මෙයට ඇතුළත් ය.

‘අක්කර 88’ සමඟ අභිරක්ෂණය කළ කලාකරු සංචාර, අභිරක්ෂක සංචාර, වැඩමුළු, හා ගැලරි කතා ඇතුළත් මහජන වැඩසටහන් 45 සඳහා නරඹන්නන් 800 අධික පිරිසක් සහභාගී වී ඇත. ඔබ මේ අවට සිටින්නේ නම්, කොළඹ 3, ක්‍රෙස්කැට් බූලෙවාඩ්හි පිහිටි MMCA ශ්‍රී ලංකා වෙත නොවරදවා පැමිණෙන්න. අපගේ පුවත් පත්‍රිකාවට ලියාපදිංචි වීමෙන් හෝ, අපගේ ෆේස්බුක් හා ඉන්ස්ටග්‍රෑම් පිටු හරහා අපගේ වැඩසටහන් පිළිබඳව තොරතුරු දැන ගන්න.

තවත් සතුටට කරුණක් නම්, පෙබරවාරි මාසයේදී STIR World සඳහා ම්‍රීන්මයී බූත් විසින් ‘අක්කර 88’ සමාලෝචනය කෙරුණු අතර, එම මාසයේ ම අපගේ ප්‍රධාන අභිරක්ෂක ශාර්මිණී පෙරේයිරා Daily News සඳහා ඉෂාර ජයවර්ධන සමඟ ශ්‍රී ලංකාවේ කෞතුකාගාරවල අනාගතය පිළිබඳව කතා කළා ය. මාර්තු මාසයේදී, Hindustan Times සඳහා නමිතා භාන්දාරේ විසින් ‘Mind the Gap’ නම් පුවත් පත්‍රිකාවේ විශේෂාංගයක් ලෙස ප්‍රදර්ශනය පළ කෙරුණු අතර, අපගේ ප්‍රධාන අභිරක්ෂක The Morningහි ශෛලේන්ද්‍රි වික්‍රම ආදිත්‍ය සමඟ සමකාලීන කලාකරුවන් පර්යේෂකයන් ලෙස දැකීමේ වැදගත්කම පිළිබඳව කතා කළා ය.

‘දෙවැනි වෙළුම: මිනෙට් ද සිල්වා විසින් කළ වටපුළුව නිවාස යෝජනා ක්‍රමය’ නම් අපගේ පළමු පර්යේෂණ ප්‍රකාශනය අප පෙබරවාරි 11 එළි දැක්වූවෙමු. සමකාලීන කලාකරුවන් වන ඉරුෂි තෙන්නකෝන්, සුමේධ කැලේගම, සහ සුමුදු අතුකෝරල විසින් කළ ‘is this an architectural documentary?’ (2023) සජීවිකෘත වාර්තා චිත්‍රපටයේ පිටපතක් ඇතුළු, ප්‍රාථමික පර්යේෂණ සහ පෙර ප්‍රකාශිත නොවුණු ආකයිවික අමුද්‍රව්‍ය ‘දෙවැනි වෙළුම’ එකට එක් කරයි. 1966දී ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයින්ගේ ආයතනය විසින් පළමු වරට ප්‍රකාශනයට පත් කළ ද සිල්වාගේ ‘Experiments in Modern Regional Architecture in Ceylon 1950 to 1960’ (1965–1966) නමැති මුඛ්‍ය රචනාවේ විශේෂ ඌනපූරණයක් ද මේ කෘතියේ අඩංගු වේ. ‘දෙවැනි වෙළුම’ සඳහා ලෝක ස්මාරක අරමුදල, බ්‍රිතාන්‍ය කවුන්සිලය, දකුණු ආසියා කලා ව්‍යාපෘතිය, සහ වීට්‍රා ඩිසයින් පදනමේ නොමසුරු සහාය ලැබුණි.

Registered Address:
117 Sir Chittampalam A. Gardiner Mawatha
Colombo 02
Sri Lanka

info@mmca-srilanka.org
www.mmca-srilanka.org

“මිනෙට් ද සිල්වා අන්තර්ජාතික පිළිගැනීමකට පාත්‍ර විය යුතුයි. ගොඩනැගිලි ඇතුළත් ඇයගේ උරුමයට හා වාස්තු විද්‍යාව සඳහා ඇයගේ ප්‍රවේශය වර්තමානයේ සැබවින් ම අනුනාද වෙනවා. ‘දෙවන වෙළුමෙහි’ ප්‍රකාශනය සඳහා ලෝක ස්මාරක අරමුදල විසින් MMCA ශ්‍රී ලංකාවට සහාය වෙන්නේ ඉහමත් සතුටින්. තවත් බොහෝ මිනිසුන් මිනෙට් පිළිබඳව දැනගත යුතුයි. මෙම ප්‍රකාශනය ඇය ගැන දනුවත්බව පැතිරවීමට උපකාර කරන අතර ඇගේ උරුමය දිගට ම පවතින බව සහතික කරනවා.”

ජෝන් ඩාලින්ටන්, ලෝක ස්මාරක අරමුදලෙහි ව්‍යාපෘති අධ්‍යක්ෂ

“‘අක්කර 88’ නම් වර්තමාන ප්‍රදර්ශනය සමඟ අනුයන MMCA ශ්‍රී ලංකාහි ප්‍රථම පර්යේෂණ ප්‍රකාශනය වන ‘දෙවැනි වෙළුමට’ අප සහාය ලබා දෙන්නේ ඉතාමත් සතුටින්. මිනෙට් ද සිල්වාගේ කාර්යය ප්‍රගතශීලි එකක් වන අතර ඇය වස්තු විද්‍යාඥයන් පරම්පරා ගණනාවකට ආභාෂය හා අනුප්‍රාණය ලබා දුන්නා. ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයන්ගේ ඊළඟ පරපුරට වගකීම් සහගත, සලකා බැලූ, හා සානුකම්පිත නිර්මාණ සැලසුම්කරණ සම්ප්‍රදායේ ඉදිරියට යාම සඳහා මෙම ප්‍රකාශනය දැනුමක් මෙන් ම දිරියක් ලබා දෙනු ඇතැයි අප බලාපොරොත්තු වෙනවා.”

ඔර්ලන්ඩෝ එඩ්වර්ඩ්ස්, ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය කවුන්සිලයෙහි අධ්‍යක්ෂ

“‘දෙවැනි වෙළුම’ ප්‍රකාශයට පත් කිරීමට අඩ වශයෙන් අරමුදල් සැපයීමට ලැබීම ගැන දකුණු ආසියා කලා ව්‍යාපෘතිය ආඩම්බර වෙනවා. MMCA ශ්‍රී ලංකා යනු ASAP සඳහා පළමු ශ්‍රී ලාංකික ප්‍රතිපාදන සහකාරක පමණක් නොව, මෙය අප සහාය ලබාදුන් පළමු කෞතුකාගාර ප්‍රකාශනය ද වෙනවා. දකුණු ආසියානු නූතන හා සමකාලීන කලාවට දායක වීමේදී සාහිත්‍යය හා ප්‍රකාශන අපට වැදගත් සාධක වෙනවා. ශ්‍රී ලාංකික කලා ඉතිහාසවල ආඛ්‍යානය පිළිබඳ තවදුරටත් හඬ නැඟීමේදී ක්ෂේත්‍රයේ ප්‍රමුඛව සිටින ශාර්මිණී පෙරේයිරාගේ දැක්ම යටතේ එන MMCA ශ්‍රී ලංකාහි අනර්ඝ කණ්ඩායමෙන් මෙම ව්‍යාපෘතිය ලැබීමට අප භාග්‍යවන්තයි.”

නූර් අස්ලම්, දකුණු ආසියා කලා ව්‍යාපෘතියෙහි (ASAP) විධායක අධ්‍යක්ෂ

බැංගලෝර්හි වෙසෙන නියා තන්ඩපානි විසින් නිර්මාණ සැලසුම් කළ සහ, ශාර්මිණී පෙරේයිරා හා කෞමදී ජයවීර විසින් සංස්කරණය කළ මෙම ප්‍රකාශනය, කෞතුකාගාරයෙන් සහ අපගේ ඉන්ස්ටග්රෑම් හා ෆේස්බුක් පිටු තුළින් මිලදී ගත හැක. ප්‍රකාශනයේ දෙමළ හා සිංහල පරිවර්තන 2024 අප්‍රේල් මස සිට අපගේ වෙබ් අඩවියේ නොමිලේ බාගත හැකි ආකාරයෙන් බෙදා හැරෙනු ඇත!

මාර්තු 21 වැනිදා කෞතුකාගාර කමිටුවේ සභාපති අජිත් ගුණවර්ධන විසින් පිළිගන්වනු ලැබූ භෝජන සංග්‍රහයකට MMCA ශ්‍රී ලංකාහි 2024 වර්ෂයේ ආදි කර්තෘ අනුග්‍රාහකයෝ සහභාගී වූහ. මෙම සන්ද්‍යාවේදී ආදි කර්තෘ අනුග්‍රාහකයන් කෞතුකාගාරයේ ප්‍රයත්න උදෙසා ඉටු කරන වැදගත් භූමිකාව ප්‍රශංසාවට ලක් වුණි.

Bird & Bear Kitchenහි ශවිනි රුබේරු විසින් 'අක්කර 88' හා මිනෙට් ද සිල්වාට ප්‍රතිචාරයක් වශයෙන් සැකසූ විශේෂ කැනපේ එකතුවකින් ආදි කර්තෘ අනුග්‍රාහකයෝ සංග්‍රහ ලැබුවෝ ය.

MMCA ශ්‍රී ලංකා විසින් මෙහෙයවන සහ SEDR ශ්‍රී ලංකා (ඵලදායිව ආරවුල් නිරාකරණයට සහයවීම) මගින් අරමුදල් සපයන ව්‍යාපෘතියක් වන 'Arts 4 ADR' ව්‍යාපෘතිය අප හඳුන්වා දෙන්නේ ඉතා උද්යෝගයෙනි. මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ වන්නේ සංවාද පෝෂණය කිරීමට, ප්‍රජා එක්සත් කිරීමට, ප්‍රත්‍යවේක්ෂණය දිරි ගැන්වීමටසහ වාර්ගික ගැටුම් සන්දර්භ තුළ ප්‍රතිසන්ධානය සඳහා විකල්ප මාර්ග ඉදිරිපත් කිරීමට කලාවට ඇති හැකියාව පරීක්ෂා කිරීමයි.

එමෙන් ම, සංවාද සහ ප්‍රජා නියැලීම සහායත්ව වැඩසටහන MMCA ශ්‍රී ලංකා දියත් කරන්නේ ආඩම්බරයෙන් ය. මෙම අධිශිෂ්‍යත්ව ඉලක්ක කරන්නේ ප්‍රජා සංවාද සහ විකල්ප ආරවුල් නිරාකරණ (ADR) ප්‍රවේශ ප්‍රවර්ධනය කිරීමෙහිලා උනන්දුවක් දක්වන ශ්‍රී ලංකාවේ උතුර, නැගෙනහිර, සහ ඌව පළාත්වල සංස්කෘතික වෘත්තිකයන් (කලාකරුවන්, ක්‍රියාකාරීන්, ලේඛකයින්, කිවිඳන්, පහසුකම් සලසන්නන්, අභිවාහකයින්, සහ අධ්‍යාපනඥයින්) වේ.

අපගේ සියලු ග්‍රාහකයින්ට සුබ සිංහල සහ දෙමළ අලුත් අවුරුද්දක් වේවා!

මෙම අවුරුදු සමයේ ඔබේ ආදරණීයයන්ට සීමිත සංස්කරණ සරම් හා සළු තෑගි කරන්න!

ජෝර්ජ් කීට්ගේ (1901–1993) සිතුවම් දෙකකින් ආභාසිත සීමිත සංස්කරණ සරමකට හෝ සළුවකට වඩා විශේෂ අවුරුදු තෑග්ගක් ඔබට හෝ ඔබේ ආදරණීයයන්ට තිබේ ද!

තව ද, ඔබේ මිලදී ගැනීම කාන්තාවන්ට සංස්කෘතික ව්‍යවසායකත්වය, නායකත්ව සංවර්ධනය, සහ මූල්‍ය කළමනාකරණ කුසලතා හා අවස්ථා ලබාදීම සඳහා Selyn පදනමට සහ ශ්‍රී ලංකා නූතන හා සමකාලීන කලා කෞතුකාගාරයට උදව්කරයි.

Selyn හා MMCA ශ්‍රී ලංකා විසින් නිර්මාණය කළ මෙම විශේෂ අත්කම් ඇඳුම්, කලා ලෝලී සියල්ලන් ම එකතු කළ යුතු ඒවායි!